www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මිලිටරිය එල්ටීටීඊයට එරෙහි උතුරුදිග ප්‍රහාරය දියත් කරයි

## Sri Lankan military launches northern offensive against LTTE

**සරත් කුමාර විසිනි**
**2007 සැප්තැම්බර් 12**

දිවයිනේ වයඹදිග වෙරල තීරයේ පිහිටි බිම් තීරුවක් අත්පත් කර ගැනීම සඳහා සැප්තැම්බර් 1 වන දා ශ්‍රී ලංකා මිලිටරිය දියත් කල නව මෙහෙයුමෙන් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිවිල් යුද්ධය තව දුරටත් තීව්‍ර කිරීමක් සලකුනු වේ. 2006 ජුලි මාසයේ දී ආරම්භ කල ප්‍රහාරයන් මාලාවක් මගින් නැගෙනහිරෙන් බොහෝ කොටසක් අත්පත් කර ගත් හමුදාව දැන් උතුරේ ඉතිරිව පවතින එල්ටීටීඊ බල කඳවුරුවලට එරෙහි ආක්‍රමනයන් දියත් කරමින් සිටී.

හමුදාව මේ වන විට වව්නියා මන්නාරම් මාර්ගයේ සිට එල්ටීටීඊ පාලනය යටතේ පවතින වන්නි ප්‍රදේශය වෙත සෝදිසි කිරීමේ ආක්‍රමන කීපයක් ම මෙහෙයවා තිබේ. උදාහරනයක් ලෙස, ජූනි 2 වන දා, ඕමන්තේ සහ පොම්පෙයිමඩු ආසන්නයේ පිහිටි එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශය අත්පත් කර ගැනීම සඳහා හමුදාංක දෙකක් සීමිත මෙහෙයුමක් දියත් කල මුත් පහරකා ආපසු එන්නට ඔවුන්ට සිදු විය. එල්ටීටීඊය එල්ල කල ප්‍රතිප්‍රහාරයක දී අඩු ගනනේ සොල්දාදුවන් 30 දෙනෙකු මිය ගිය අතර, 82 දෙනෙක් තුවාල ලදහ. කාලතුවක්කු ස්ථාපිතයන් හතරක් විනාශ කල එල්ටීටීඊය මිලිටරිමය මෙවලම් අත්පත් කර ගත්තේ ය.

මෑත ම ප්‍රහාරයේ දී මිලිටරිය, උතුරු පලාතේ දකුනු මන්නාරමේ පිහිටි සිලාවතුරේ ප්‍රදේශය සහ ඊට යාබද අරිප්පු, කොන්ඩච්චි හා මුල්ලිකුලම් ඇතුලු ධීවර ගම්මාන කීපයක් ද අත්පත් කර ගත්තේ ය. වන්නි ප්‍රදේශයේ පිහිටි උතුරුදිග ප්‍රධාන එල්ටීටීඊ කඳවුරුවලින් මේ ප්‍රදේශය වෙන් කොට තිබෙන නිසා හමුදාව මුහුන දුන්නේ සුලු ප්‍රතිරෝධයකට ය. මෙහි බහුතරයක් දෙමල වන අතර සිය ගනනක් මුස්ලිම් ජනයා ද වෙති.

මුහුද හරහා ශ්‍රී ලංකාවට හොරෙන් ගෙන එනු ලබන ආයුධ ගොඩ බාන එල්ටීටීඊයේ ප්‍රධාන සංක්‍රමන කඳවුර ආක්‍රමනය මගින් අත්පත් කොට ගෙන ඇති බවට මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ පාරම් බෑවේ ය. හමුදාව එල්ටීටීඊයට "බරපතල හානි" පමුනුවා ඇති බව කියා සිටි මුත් ඔහු සංඛ්‍යා ලේඛන කිසිවක් ඉදිරිපත් කලේ නැත. පෙනී යන පරිදි, හමුදාව විසින් පාලනය කරන ප්‍රදේශවලින් වට වුනු රැක ගැනීමට දුෂ්කර මිමාන එල්ටීටීඊය විසින් අත් හැර දැමුනි.

මෙහෙයුම් සිදු කරන්නේ "ආරක්ෂක" සහ "මානුෂීය" පියවරක් වශයෙන් ය යන මුසාව දිගින් දිගට ම පවත්වා ගෙන යන ආන්ඩුව හා මිලිටරිය, 2002 සටන් විරාමය උල්ලංඝනය කරමින් එල්ටීටීඊ පාලන ප්‍රදේශය අත්පත් කර ගැනීමේ අප්‍රකාශිත අරමුනු ද එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් විනාශ කිරීම ද වසං කර ගෙන සිටින්නේ යන්තමිනි. පූර්ව ආක්‍රමනවල දී මෙන් ම, මිලිටරිය සිය මෙහෙයුම දියත් කලේ අඛන්ඩ කාලතුවක්කු ප්‍රහාර යොදා ගනිමින් සහ මල්ටි බැරල් රොකට් විදිනයන් භාවිතයට ගනිමිනි. අවතැන් වූ දහස් ගනන් ජනයාට දැන් මුරුන්කන්හි සහ නනත්තන්හි පිහිටි සරනාගත කඳවුරු දෙකක වාසස්ථාන සපයා තිබේ.

සටන්වලින් පලා යමින් සිටි සරනාගතයන්ගෙන් පිරි වෑන් රථයකට ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. නව දෙනෙකු එතැන දී ම මරනයට පත් වූ අතර, ලද තුවාල හේතු කොට ගෙන තවත් සිව් දෙනෙක් පසුව මිය ගියහ. ප්‍රදේශය තුළ භීෂනය හා ව්‍යාකුලත්වය වැපිරීමේ ඉලක්කය ඇතිව බෝම්බය ඇටවූ බවට එල්ටීටීඊය ඇත පිහිටි මිලිටරි කඳවුරුවලින් එකකට චෝදනා කලේ ය. චෝදනාව ප්‍රතික්ෂේප කල මිලිටරිය බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් එල්ටීටීඊයට දෝෂාරෝපනය කල නමුත්, එල්ටීටීඊයට ප්‍රදේශයේ දෙමල ජනයා ඝාතනය කරන්නට වුවමනා කරන්නේ මන්ද යන කරුන පැහැදිලි කලේ නැත.

නාවික හමුදා ප්‍රකාශක ඩී.කේ.පී. දිසානායක වෙරලබඩ බිම් තීරුව අත්පත් කර ගැනීමේ දිගු කාලීන අරමුනු හඳුනා ගනිමින් අදහස් දැක්වී ය. මිලිටරියේ රැඳී සිටීම ශක්තිමත් කිරීම සඳහා නාවික හමුදාව කඳවුරු දෙකක් පිහිටුවන බව නිවේදනය කල ඔහු ආන්ඩුවේ ව්‍යාපෘතීන් ආරක්ෂා කලේ ය. ආර්ථිකමය වශයෙන් ප්‍රදේශය තුල පවතින විභව ශක්තිය පිලිබඳව අවධානය යොමු කරමින් හේ මෙසේ ද කී යඃ "මුල්ලිකුලම්හි සහ සිලාවතුරේහි නාවික හමුදා කඳවුරු පිහිටුවීම මන්නාරම් බොක්ක ප්‍රදේශයෙහි තෙල් සෙවීමේ වැඩ කටයුතුවලට ආරක්ෂාව සපයන්න උදව් වේවි."

සැප්තැම්බර් 3 දා පුවත්පත් ඇමතු ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල, ආන්ඩුව "ප්‍රධාන පෙළේ මිලිටරි ආක්‍රමනයකට" සූදානම් වෙමින් සිටින්නේ ය යන්න පිලිබඳ ඇඟවුම්වල සැර බාල කරමින් කතා කලේ ය. ඒ අතර හේ මෙසේ ද පැවසී යඃ "අපේ ඉලක්කය එල්ටීටීඊයෙන් දෙමල ජනයා මුදා ගන්න එක යි. අපි මේක කරන කොට ක්‍රියාවලිය ආක්‍රමනයක් හරි මොකක් හරි කියල නිර්වචනය කරන්න පුලුවන්. ඒත් ඒකෙන් අදහස් වෙන්නෙ නැහැ සාම කතාවලට දොර වහල යි කියල."

ආන්ඩුවේ හා එල්ටීටීඊයේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල සීමාමායිම් නියම කල 2002 සටන් විරාමයේ පදනම් ආන්ඩුව තව දුරටත් නොපිලිගන්නා බව රඹුක්වැල්ල පැහැදිලිව ම කියා සිටියේ ය. "සටන් විරාම ගිවිසුමෙන් සීමාමායිම් නියම කෙරුවත් එල්ටීටීඊයට අයිති කිසි ම භූමි ප්‍රදේශයක් තිබුනෙ නැහැ. සියලු ප්‍රදේශ අයිති ශ්‍රී ලංකාවේ ආන්ඩුවට සහ මහජනයාට. ඒ නිසා පැවතුනු දේ තාවකාලික වැඩ පිලිවෙලක් විතර යි," ඔහු කියා සිටියේ ය.

"දෙමල ජනයා මුදා ගැනීම" පිලිබඳ ඔහුගේ කතාව විකාරයකි. දෙමල ජනයා මත සිය පාලනය පවත්වා ගෙන යාම සඳහා එල්ටීටීඊය නිසැක වශයෙන් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමයන් යොදා ගන්නා අතර, රාජපක්ෂ ආන්ඩුව සිංහල අධිපතිවාදය මත පදනම්ව සමස්ත දෙමල සුලුතරය ම සතුරා ලෙස සලකයි. නැගෙනහිර "මුදා ගත්" ප්‍රදේශවල දී ආරක්ෂක හමුදා විසින් පනවනු ලැබ තිබෙන්නේ, නව ආර්ථික ව්‍යාපෘතීන් ආරක්ෂා කිරීමට සහ ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීමට අධිආරක්ෂිත කලාප සහිතව පරිපූර්නත්වයට පත් කරන ලද මිලිටරි පාලනයකට සමාන තත්ත්වයකි.

ආන්ඩුවට උතුරේ ආක්‍රමනයක් දියත් කිරීමේ සැලැස්මක් නොතිබුනු බව විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම අගෝස්තු 30 දා මැලේසියාවේ දී ප්‍රකාශ කලේ ය. රොයිටර් පුවත් සේවයට කතා කරමින් ඔහු මෙසේ අවධාරනය කලේ යඃ "එල්ටීටීඊය ආපහු සාකච්ඡා මේසයට එන එක අපට අවශ්‍ය යි." ව්‍යවස්ථාව පිලිබඳ සර්ව පාක්ෂික කමිටුවකට යුද්ධයට දේශපාලනික විසඳුමක් ලබා දීම සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීමට ආන්ඩුව උත්සාහ කරමින් සිටි බව ඔහු පැවසී ය.

මේ සියලු දෙපිටකාට්ටු කතා නිශ්චිත දේශපාලන අරමුනකට සේවය කරයි. ආන්ඩුව එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් විනාශ කිරීමට තීරනය කර ගෙන සිටින අතර, ජනාධිපති මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සාම ක්‍රියා දාමය මගින් එල්ටීටීඊය අවනත කර ගැනීම පිලිබඳ මිථ්‍යාව පවත්වා ගෙන යයි. ඔහුගේ නව ආක්‍රමනකාරී යුද්ධය නො තකා සිටීමට එක්සත් ජනපදයටත් අනෙකුත් ප්‍රධාන බලවතුන්ටත් ඉඩ සලසා දීමට මෙම පට්ට ගැසුනු කූටෝපාය ප්‍රමානවත් ය.

දේශීය වශයෙන් වර්ධනය වන විරුද්ධත්වයකට ද ආන්ඩුව මුහුන දෙමින් සිටී. විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය ජූනි මාසයේ දී පවත්වන ලද ජනමත විමසුමකින් වාර්තා වූයේ, සිංහල ජනයාගෙන් සියයට 53ක් ද ඇතුලුව සියලු ප්‍රජාවන්ට අයත් ජනයාගෙන් සියයට 70ක් යුද්ධය අවසන් කිරීම සඳහා "සාම සාකච්ඡා" යොදා ගැනීමට කැමැත්ත පල කරන බව යි. මිලිටරි වැය තියුනු ලෙස ඉහල යාම, සාමාජීය වියදම් හා සහනාධාර කප්පාදුවලට සහ මිල ගනන් ඉහල යාමට තුඩු දී තිබේ. මේ සියල්ල පුලුල්ව පැතිර පවතින අතෘප්තිය වැඩි දියුනු කරමින් තිබේ.

ආර්ථිකමය වශයෙන් ඇති වන බලපෑම නො තකා යුද්ධය දිගට ම ගෙන යන බව ආන්ඩුව පැහැදිලිව ම ප්‍රකාශයට පත් කොට තිබේ. ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ අගෝස්තු 26 දා මිලිටරියේ විසිර යාමේ පෙලපාලියක දී මෙසේ කීවේ යඃ "නැගෙනහිර දී මුදා ගත්ත වගේ ම, වන්නි ප්‍රදේශයේ මුදා නොගත් ඉතිරි ප්‍රදේශත් එල්ටීටීඊයේ අත් අඩංගුවෙන් මුදා ගන්න ආන්ඩුව අධිෂ්ඨාන කර ගෙන ඉන්නවා.... ජීවන වියදම නොනැවතී ඉහල යනව ය කියන එක හේතුවක් කර ගෙන මිලිටරි ක්‍රියාවන් අත හැරල දාන්නෙ නැහැ."

යුද හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා අගෝස්තු 15 දා *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පතට කල සැඳහුම්වල දී සෘජුව ම මෙන් මෙසේ පැවසී යඃ "රටකින් බාගයක් තියා ගෙන අවසන් වෙනවට වැඩිය හොඳයි බංකොලොත් වෙච්ච රටකින් අවසන් වෙන එක. සතුරා පරාජය කරල රට බේර ගන්න අවශ්‍ය නම් කැප කිරීම් කීපයක් සිද්ධ කරන්න වෙනවා." "බිත්තියට ම හේත්තු කෙරිල දුවන්න තැනක් නැති වෙන" නිසා එල්ටීටීඊය උතුරේ දී සටන් වදිනු ඇති බවට ඔහු අනතුරු ඇඟවී ය. අමතර සොල්දාදුවන් 20,000ක් බඳවා ගැනීමට මිලිටරිය උත්සාහ කරමින් සිටින බව ඔහු කී ය.

කම්කරු ජනයා මත වඩ වඩාත් බර පැටවෙනු ඇත. පසු ගිය වසරේ දී රාජපක්ෂ ආන්ඩුව යුද්ධය යලි ඇරඹූ තැන් පටන් 5,000කට වැඩි ජනයා ඝාතනයට ලක් වී තිබේ. තවත් සිය ගනනක් "අතුරුදන් වී" නැත් නම් මිලිටරිය හෝ ඒ හා සහයෝගී පැරාමිලිටරි කන්ඩායම්වලින් මෙහෙයවෙන ඝාතක කල්ලි විසින් ඝාතනය කොට තිබේ. තවත් 200,000ක් දෙනා සටන් නිසා අවතැන් වීමට ගොදුරු වී තිබේ. බොහෝ දෙනා සුදුසු ආහාර, වාසස්ථාන හා සේවා පහසුකම් නොමැතිව ජරපත් සරනාගත කඳවුරුවල දිවි ගෙවති. වන්නියේ එල්ටීටීඊය පාලනය යටතේ පවතින ප්‍රදේශ වෙත සිදු කරන කවර හෝ පූර්න පරිමාන ආක්‍රමනයකින් වුව සිදු වනු ඇත්තේ තව තවත් මානුෂීය ව්‍යසනයන් ඇති වීම පමනකි.


© www.wsws.org